// Sri Lanka crest (logo) //

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 1805/9 - 2013 අප්‍රේල් මස 09 වැනි අඟහරුවාදා - 2013.04.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

2013 අංක .......... දරන බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය

1989 අංක 04 දරන බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය සංශෝධන කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ. :–

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

1. මෙම ප්‍රඥප්තිය 2013 අංක .......... දරන බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලබන දින සිට ක්‍රියාත්මක වන්නේය.

*ප්‍රධාන ප්‍රඥප්තියේ පූර්විකාව සංශෝධනය කිරීම*

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන 1989 අංක 04 දරන බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තියේ පූර්විකාවෙහි සඳහන් අවසාන වචනය වන "පනතකි" යන්න ඉවත් කර, ඒ වෙනුවට "ප්‍රඥප්තියකි" යන වචනය ඇතුළත් කරමින් ප්‍රඥප්තියේ පූර්විකාව මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 4(6) උප වගන්තිය සංශෝධනය කිරීම*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4(6) උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරමින් එකී වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4(6) මේ ප්‍රඥප්තියේ විධිවිධාන වලට යටත්ව පළාත්බද අධිකාරියේ රැස්වීම් හා/හෝ රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්යය පටිපාටිය සම්බන්ධයෙන් පළාත් සභා අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය හැක්කේය.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 07 වන වගන්තිය සංශෝධනය කිරීම*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරමින් එම වගන්තිය මෙසේ සංශෝධනය කරනු ලැබේ :-

7 (1) (5) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත ඃ-

(අ) එම ප්‍රදේශවල ඒකාබද්ධ මාර්ග සැළසුම් සකස් කිරීම හා මාර්ග සංවර්ධනය කිරීම ;

(ආ) එම ප්‍රදේශවල ඒකාබද්ධ මාර්ග සැළසුම් සකස් කිරීම හා අනුකූල වූ ඒ ප්‍රදේශවල මාර්ග සංවර්ධන හා සම්බන්ධිත වැඩ ක්‍රියාකාරකම් හා සේවාවන් හා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ;



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) මූලධන ආයෝජන සැලසුම් ඇතුළුව මාර්ග සංවර්ධන සැලසුම් සම්පාදනය කිරීම හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීම ;

(ඈ) යම් මාර්ග සවර්ධන ව්‍යාපෘති කරගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හා/හෝ එකඟවීම්වලට ඇතුළත් වීම, ඒවා ඉටු කිරීම හා/හෝ කරගෙන යාම ;

(ඉ) යම් මාර්ග සංවර්ධන ව්‍යාපෘති කරගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය හවුල් ව්‍යාපාර ගිවිසුම් වලට ඇතුලත් වීම හා/හෝ ඒවා ඉටු කිරීම හා/හෝ කරගෙන යාම ;

(ඊ) යම් තැනැත්තෙකු හෝ ආයතනයක් විසින් යම් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් හා/හෝ යෝජනා ක්‍රමයක් නිම කිරීමට අපොහොසත් වන හා/හෝ පැහැර හරින අවස්ථාවක එම ව්‍යාපෘතිය හා/හෝ යෝජනා ක්‍රමය නිම කිරීමට භාර ගැනීම ;

(උ) යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්පත්කර ගැනීම හා/හෝ මිලට ගැනීම සහ දැරීම, එම අත්පත් කරගත් හා/හෝ මිලටගත් චංචල හෝ නිශ්චල දේපළ බැහැර කිරීම හා/හෝ බද්දට දීම ;

(ඌ) යම් ආයතනයක ඉල්ලීම මත, එම ආයතනය උදෙසා මාර්ග සංවර්ධන ව්‍යාපෘති සහ සැලසුම් යෝජනාක්‍රම සකස් කිරීම හා/හෝ ව්‍යාපෘති හෝ යෝජනා ක්‍රම ක්‍රියාවේ යෙදවීමේ දී ඒවා සම්බන්ධීකරණය කිරීම හා/හෝ ඊට සහාය වීම ;

(එ) යම් ආයතනයක හෝ නැනැත්තන්ගේ සුබසිද්ධිය පිණිස මාර්ග සැලසුම් සේවා සැපයීම ;

(ඒ) පළාත්බද අධිකාරිය විසින් සපයනු ලබන කවර වූ හෝ සේවාවන් සඳහා මිලක් හා/හෝ ගාස්තුවක් නියම කිරීම හා අය කර ගැනීම ;

(ඔ) මුදලින් හා/හෝ අන්‍යාකාරයෙන් ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග හා/හෝ ආධාර භාරගැනීම් ;

(ඕ) යම් මර්ගයක මාර්ග රකෂිතයක් යම් උපයෝගිතා සේවා සපයන්නකු විසින් භාවිත කිරීම සඳහා අවසර දීම, එම කාර්යයන් සඳහා කුලියක් නියම කිරීම, අයකිරීම සහ එම කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි පරිදි ගිවිසුම් වලට එළඹීම ;

(ක) යම් මාර්ග රක්ෂිතයක දැන්වීම් ප්‍රදර්ශනය, බැනර් ප්‍රදර්ශනය, පුවරු හෝ විශාල දැන්වීම් පුවරු සවිකිරීම සඳහා හෝ වෙනත් යම් වාණිජ කාර්යයක් සඳහා යම් තාවකාලික ව්‍යුහයක් ඉදිකිරීම වෙනුවෙන් යම් තැනැත්තකුට හෝ ආයතනයකට අවසරදීම, ඒ සඳහා එම තැනැත්තාගෙන් හෝ ආයතනයෙන් අයවිය යුතු කුලිය නියම කිරීම හා අය කිරීම සහ එකී කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි ගිවිසුම් වලට එළැඹීම ;

(ග) මෙම ප්‍රඥප්තිය යටතේ එහි බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම ඉටු කිරීම සහ සිදුකිරීම සඳහා අනුෂාංගික හා හිතකර වෙනත් යම් සියලු ක්‍රියා සිදු කිරීම.

(2) (අ) යම් ආයතනයක ඉල්ලීම අනුව එකී ආයතන වෙනුවෙන් පළාත තුළ හෝ ඉන් පිටත මාර්ග සංවර්ධන ව්‍යාපෘති හා/හෝ වෙනත් ඉදිකිරීම් සඳහා ව්‍යාපෘති හා/හෝ යෝජනා ක්‍රම පිළියෙල කිරීම හා/හෝ ඒ සඳහා අවශ්‍ය ඉංජිනේරු උපදේශක සේවා සැපයීම හා/හෝ ඒ ව්‍යාපෘති හෝ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ;

(ආ) ඉහත (අ) වගන්තියේ සඳහන් කාර්යය හා කර්තව්‍යය සඳහා අවශ්‍ය වන යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්පත්කර ගැනීම හා/හෝ මිලට ගැනීම සහ දැරීම, එම අත්පත් කරගත් හා/හෝ මිලටගත් චංචල හෝ නිශ්චල දේපළ බැහැර කිරීම හා/හෝ බද්දට දීම ;

(ඇ) ඉහත (අ) ජේදයේ සඳහන් කාර්යය හා කර්තව්‍යය ඉටුකිරීම සඳහා අව්‍යශ විය හැකි සියලු ගිවිසුම් හා/හෝ එකඟවීම්වලට ඇතුළත්වීම ;

(ඈ) ඉහත (අ) ජේදයේ සඳහන් කාර්යය හා කර්තව්‍යය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි හවුල් ව්‍යාපාර ගිවිසුම් වලට ඇතුළත්වීම හා/හෝ ඉටුකිරීම හා කරගෙන යාම ;

(ඉ) ඉහත (අ) ජේදයේ සඳහන් කාර්යය හා කර්තව්‍යය ඉටුකිරීම සඳහා අවශ්‍ය ශාඛා කාර්යාල පිහිටුවීම, කාර්ය මණ්ඩල හා සේවකයින් කොන්ත්‍රාත් තදුවිත, තාවකාලික හෝ පැවරුම් පදනමින් බඳවාගැනීම, ඉවත් කිරීම සේවා නියම හා කොන්දේසි නියම කිරීම, වැටුප් හා පාරිශ්‍රමික නියම කිරීම, විනය පාලනය සිදුකිරීම ;

අධිකාරියේ බලතල කාර්යය හා කර්තව්‍ය විය යුතුය.

(3) (අ) 7(1) (උ) සහ 7(2) (ආ) ජේදයන්හි සඳහන් පරිදි නිශ්චල දේපල බැහැර කිරීම පළාත් සභා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යටත්ව කල යුතු වන්නේය.

(ආ) 7(1) (උ) සහ 7(2) (ආ) ජේදයන්හි සඳහන් පරිදි නිශ්චල දේපල බදු දීමේදී මාර්ග රක්ෂිත එකී බදුදීමට ඇතුළත් නොවිය යුත්තේය.

(4) 7(1) (ඉ) හා 7(1) (ඇ) ජේදයන්හි සඳහන් පරිදි හවුල් ව්‍යාපාර ගිවිසුම් වලට එළඹීමේදී ඒ සඳහා පළාත් සභා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුත්තේය.

(5) (1) වන උපවගන්තිය යටතේ ස්වකීය බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි සහ ඉටු කිරීමෙහි ලා යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත මාර්ග සැලසුම් කිරීම හෝ මාර්ග සංවර්ධනය හා සම්බන්ධ යම් සංවර්ධන වැඩසටහනක් සකස් කරන විට හෝ ක්‍රියාත්මක කරන විට, යෝජිත වැඩ කටයුතුවලින් යම් ආයතනයක අයිතිවාසිකම්, සම්බන්ධතා හෝ කර්තව්‍යයන් කෙරෙහි බලපෑමක් ඇතිවේද අවස්ථාවෝචිත පරිදි ඒ ආයතනයෙන් විමසා එකී සංවර්ධන වැඩසටහන් සකස් කිරීම හා/හෝ ක්‍රියාත්මක කිරීම පළාත්බද අධිකාරිය විසින් කළයුතු වන්නේ ය.

(6) (1) වන උපවගන්තිය යටතේ ස්වකීය බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි සහ ඉටු කිරීමෙහි ලා යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත මාර්ග සැලසුම් කිරීම හෝ මාර්ග සංවර්ධනය හා සම්බන්ධ යම් සංවර්ධන වැඩසටහනක් සකස් කරන විට හෝ ක්‍රියාත්මක කරනවිට, යම් පළාත් පාලන ආයතනයකට අයත් ප්‍රදේශයක් ඒ සංවර්ධන ප්‍රදේශයට ඇතුළත් වන්නේ නම් හෝ අතිව්‍යාප්ත වන්නේ නම්, පළාත්බද අධිකාරියේ එම සංවර්ධන වැඩසටහන හා සම්බන්ධ රැස්වීමට හෝ රැස්වීම්වලට පැමිණ සහභාගී වන ලෙස එම පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයාට හෝ සභාපතිවරයාට සහ අවස්ථාවෝචිත පරිදි, එම නගරාධිපතිවරයා හෝ සභාපතිවරයා විසින් නම් කරන ලද ඒ පළාත් පාලන ආයතනයේ නිලධරයකුට ආරාධනා කිරීම, පළාත්බද අධිකාරිය විසින් කළයුතු වන්නේ ය.

5. 7(1) උප වගන්තියේ (ඕ) හා (ක) ජේද යටතේ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පළාත් සභා අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය හැක්කේය. *7 වගන්තිය යටතේ රීති සෑදීම.*

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරමින් එකී වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

*ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.*

13 (1) (2) වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව සහ පළාත් සභා අමාත්‍යවරයාගේ ලිඛිත කැමැත්ත ඇතිව අධිකාරිය විසින් මේ ප්‍රඥප්තියේ කාර්යය ඉටුකිරීමේ දී වූ යම් බැඳීම් අවශ්‍ය වන්නා වූ මුදල් පහත දැක්වෙන ආකාරයට ණයට ගැනීම හෝ සපයා ගැනීම කරනු ලැබිය හැකිය :-

(අ) තාවකාලික බැංකු අයිරා හෝ වෙනත් ආකාරයකට හෝ

(ආ) ණයකර සහ බැඳුම්කර හෝ විකුණුම් ණයකර මගින්.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් ලබාගෙන ඇති යම් ණය මුදලක හෝ අරමුදලක ගෙවා අවසන් නොවන්නා වූ මුළු මුදල පළාත් සභා අමාත්‍යවරයා විසින් මුදල් විෂය භාර පළාත් සභා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණයකට වඩා කිසිම විටක වැඩි නොවිය යුතුය.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 15(1) උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරමින් එකී වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :- *ප්‍රධාන ප්‍රඥප්තියේ 15 (1) උප වගන්තිය සංශෝධනය කිරීම.*

15 (1) පළාත්බද අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම සහ රීති සෑදීමට මෙම ප්‍රඥප්තියෙන් බලය දෙනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු කරුණක් හා/හෝ කාරණා සම්බන්ධයෙන් පළාත් සභා අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය හැක.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ අර්ථනිරූපණ වගන්තියේ "ජාතික මහාමාර්ගය" යන අර්ථනිරූපණයට ඉක්බිතිව පහත සඳහන් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් එම අර්ථනිරූපණ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"ආයතනය" යන්නෙන් රජයේ යම් අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක්, අධිකාරියක්, මණ්ඩලයක්, පළාත් සභාවක්, පළාත් සභා අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක්, අධිකාරියක් හෝ පළාත් පාලන ආයතනයක් අදහස් වේ.

"තැනැත්තෙක්" යන්නෙන් නෛතික පුද්ගලයෙකු හවුල් ව්‍යාපාරයක් හෝ ස්වභාවික පුද්ගලයකු අදහස් වේ.

"උපයෝගී සේවා සපයන්නෙකු" යන්නෙන් ජලය, විදුලිය, දුරකථන හා වෙනත් සන්නිවේදන සේවා සපයන්නන් අදහස් වේ.

04 - 699

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.